# කාර්යය සාධන වාර්තාව - 2015
# செயலாற்றுகை அறிக்கை - 2015
# Performance Report -2015









නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சு
Ministry of Housing & Construction

**නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

# කාර්යය සාධන වාර්තාව 2015

**දෙවැනි මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල**

## ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය



ගෙවී ගිය වසර ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නව ප්‍රතිපත්තිමය තීරණ හා ක්‍රියාමාර්ග රැසකට අවතීර්ණ වූ වසරක් ලෙස හැඳින්විය හැක. මෙරට නිවාස සංවර්ධන ක්ෂේත්‍රයේ ස්වර්ණමය කාල පරිච්ඡේදය ලෙස සැලකෙන රණසිංහ ප්‍රේමදාස යුගයෙන් පසුව “ස්වකීය නිවසක හිමිකම” උරුම කර ගැනීමේ ජනතා පැතුම ජන සිත්වලින් දුරස්ව ගොස් ඇති බව 2015 වර්ෂය වන විට නිවාස අයිතිය අහිමි පවුල් සංඛ්‍යාව ලක්ෂ 12-15ත් අතර සංඛ්‍යාවක් දක්වා වර්ධනය වීමෙන් මනාව පිළිබිඹු වේ. 2015 වර්ෂය ආරම්භයේදී මෙරට සිදු වූ දේශපාලන බල හුවමාරුවත් සමඟ වත්මන් යහපාලන රජය යටතේ නැවත වරක් සීඝ්‍ර නිවාස සංවර්ධන වැඩපිළිවෙලක් සඳහා අප විසින් ප්‍රමුඛතාවය ලබා දී ඇත. ඒ අනුව දින 100 කඩිනම් නිවාස සංවර්ධන වැඩසටහන හරහා ප්‍රජා සහභාගීත්වය සහිත නව නිවාස 50000ක් ඉදිකිරීම සඳහා ඉතා අඩු පොලී අනුපාතයක් යටතේ රු. 100000/= බැගින් සහන ණය ලබාදීමට කටයුතු කරන ලදී. එමඟින් දිවයිනේ සෑම මැතිවරණ කොට්ඨාශයක් සඳහාම නව නිවාස 300ක් බැගින් ඉදිකිරීමට ඉලක්ක කෙරිණි. ඊට අමතරව දිවයිනේ තෝරාගත් දිළිඳු පවුල් සඳහා නිවාස ආධාර ලබාදීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කරන ලද අතර රජය විසින් ගනු ලැබූ තීරණයකට අනුව මෙම ප්‍රජා සහභාගීත්ව නිවාස සංවර්ධනය පදනම් කර ගෙන උදාගම් ව්‍යාපාරය ආරම්භ කරන ලදී. එමෙන්ම ජූනි මස 23 වැනිදා ජාතික නිවාස දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීම මෙම වර්ෂයේදී ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් විය.

තවද මෙම වර්ෂයේදී “ආදර්ශ ගම්මාන” වැඩපිළිවෙල නැවත වරක් සක්‍රිය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර එහි ආරම්භක පියවර වශයෙන් දිවයිනේ තෝරාගත් දිස්ත්‍රික් 17ක නිවාස ඒකක 25 කින් සමන්විත ආදර්ශ ගම්මාන 38ක ඉදිකිරීම් ආරම්භ කිරීමට හැකියාව ලැබීම නිවාස සංවර්ධන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා ගත් වර්ධනීය ප්‍රවේශයක් ලෙස හැඳින්විය හැක. එමඟින් රජය විසින් ලබා දෙන පර්චස් 15-20ත් අතර බිම් කොටසක ප්‍රජා සහභාගීත්වය සහිතව ස්වකීය නිවාස ඉදිකර ගැනීම සඳහා ලබා දෙන සහන පොළී ණය මුදල රු. 250000/= කි. මෙම වැඩපිළිවෙල වඩාත් පුළුල් කරගනිමින් 2016 වර්ෂයේදී දිවයින පුරා “ආදර්ශ ගම්මාන” 200ක් ඉදිකිරීම අපගේ අපේක්ෂාවයි.

“විවෘත භූමිය සැමට” යන තේමාව යටතේ පැවති ලෝක ජනාවාස දිනයට සමගාමීව පුළුල් වැඩසටහන් රැසක් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට මෙම වසරේදී හැකියාව ලැබුණු අතර දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන අයුරින් එක් දිස්ත්‍රික්කයකින් කපරාරු නොකල නිවාස 1000 බැගින් තෝරා ගනිමින් එම නිවාසවල වැඩ නිම කර ගැනීම සඳහා අවශ්‍ය සිමෙන්ති ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය, නිවාස ඒකක 25000ක් සඳහා සැපයීම ලෝක ජනාවාස දිනයට සමගාමීව සිදුකරන ලද ප්‍රධාන ව්‍යාපෘතියක් විය. තවද නිවාස යෝජනා ක්‍රමවල නිවාස සමිති යාවත්කාලීන කිරීම, “නගමු පුරවර” යටතේ අගනුවර ඉපැරණි මහල් නිවාස යෝජනා ක්‍රමවල ගොඩනැගිලි පිළිසකර කර ඒවායේ අයිතිය නිවාසලාභීන්ට පවරා දීම හා අගනුවර, උතුරු - නැගෙනහිර ඇතුළු දිවයිනේ සෙසු ප්‍රදේශවල නිවාසලාභීන්ට සින්නක්කර ඔප්පු ප්‍රදානය කිරීම ලෝක ජනාවාස දිනයට සමගාමීව දියත් කරන ලද සුවිශේෂී වැඩසටහන් වේ.

මෙරටට ගැලපෙන ආකාරයේ තිරසාර ඉදිකිරීම් ප්‍රතිපත්තියක් සකස් කිරීමේ ක්‍රමවේදය ද මේ වසරේදී ආරම්භ කරන ලද අතර එකී ප්‍රතිපත්තිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම අපගේ අපේක්ෂාව වේ. ඉකුත් වසර ගණනාව පුරාවටම දේශපාලනීකරණය වීමෙන් විනාශයට පත් මෙරට ප්‍රමුඛ පෙළේ ඉදිකිරීම් ඉංජිනේරු ආයතනයක්වූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව නැවත වරක් සක්‍රිය තත්ත්වයට පත් කිරීමට මෙම

වසරේදී හැකියාව ලැබිණි. ඒ අනුව එළඹෙන 2016 වර්ෂයේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වර්ධනයක් අත්කර ගැනීම අපගේ අපේක්ෂාව වේ.

ඉදිරි මාස 60ක කාලය තුළ නාගරික මධ්‍යම පාන්තික ජනතාව සඳහා නව නිවාස ඒකක 500000ක් ඉදිකිරීම සඳහා වූ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ කඩිනම් වැඩපිළිවෙල සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සුවිශේෂී දායකත්වයක් සපයනු ඇත. ඒ සඳහා මෙම අමාත්‍යාංශය යටතේ පවතින ජාතික නිවාස සංවර්ධනය අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ඕෂන්විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම හා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව යන ආයතන සක්‍රියව සම්බන්ධ වනු ඇත.

මෙරට සීඝ්‍ර නිවාස සංවර්ධනය සඳහා රාජ්‍ය අංශයෙන් නිසි ඇගයීමක් හිමිවීම අපගේ ඉමහත් ධෛර්යයට ඉවහල් වන අතර එහි ලා විදේශිකයන්ගෙන් ලැබෙන පරිත්‍යාග හා පෞද්ගලික අංශයේ පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන ආධාර අපගේ ඉමහත් ඇගයීමට පාත්‍ර විය. අවශ්‍ය වියදම් හා නාස්තිය මුලිනුපුටා දමමින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඵලදායී සමාජ මෙහෙවරක් ඉටුකිරීම අපගේ වගකීමයි. වසර 2025 වන විට මෙරට නිවාස අහිමි සෑම පවුලකටම ස්වකීය නිවසක හිමිකම උරුම කරදීම අපගේ ඉලක්කයයි.

**සජිත් ප්‍රේමදාස**
**නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය**

## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක වන කඩිනම් සංවර්ධන ක්‍රියාදාමයේ පෙරගමන්කරුවෙකු ලෙසින් දිදුළන සේවාවක් ඉටුකරනු ලබන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ 2015 කාර්යය සාධන වාර්තාව සඳහා පණිවුඩයක් සනිටුහන් කිරීමට අවකාශ ලැබීම ඉමහත් සතුටකි.

අප රටේ ජීවත්වන සෑම පුරවැසියෙකුටම ස්වකීය නිවසක හිමිකම තහවුරු කරමින් ක්‍රියාවට නැංවෙන “සැමට සෙවණ” ජාතික නිවාස වැඩසටහන යටතේ, පවුල් 50,000ක් සඳහා නිවාස පහසුකම් ලබාදීමේ නිවාස සංවර්ධන වැඩසටහනත්, පවුල් දහසකට ආසන්න සංඛ්‍යාවකට මූලික නිවසක අයිතිය ලබාදෙමින් ක්‍රියාත්මක වන ගම්මාන 38කින් සමන්විත ආදර්ශ ගම්මාන වැඩසටහනත්, දිවයින පුරා නිවාස 25,000ක් පිළිසකර කිරීම සඳහා ක්‍රියාවට නැංවෙන සිමෙන්ති ආධාර වැඩසටහනත්, ගතවූ වසරක කාලපරිච්ඡේදය තුළ වත්මන් රජයේ සංවර්ධන ක්‍රියාදාමයේ සුවිශේෂී කාර්යයන් ලෙස සඳහන් කළ හැක.

මෙයට අමරතව ප්‍රථම වරට ප්‍රකාශයට පත්කෙරුණු, ජූනි මස 23 “ජාතික නිවාස දිනය” හා සෑම වසරකම ඔක්තෝම්බර් මස ප්‍රථම සඳුදා දිනට යෙදෙන “ලෝක ජනාවාස දිනය” නිමිති කොටගෙන මෙරට නිවාස හා ජනාවාස සංවර්ධනය උදෙසා සංවර්ධන කාර්යයන් රැසක් ක්‍රියාත්මක කිරීමට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන සමත්ව තිබේ.

එමෙන්ම 2016 වසරේ ආරම්භ කෙරෙන මධ්‍යම පාන්තික ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස ලක්ෂ 05ක් ඉදිකිරීමේ ජාතික වැඩපිළිවෙල ප්‍රකාරව, කොළඹ නගරයේ මෙතෙක් නොවිසඳුනු නිවාස ගැටළුවලට මෙන්ම දිවයිනේ සෙසු නාගරික ප්‍රදේශ තුළ නිවාස අවශ්‍යතාවය සපුරාලීමට ද සුවිශේෂී දායකත්වයක් ලබාදීමටද හැකියාව ලැබෙනු ඇත.

තවද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සුවිශාල සංවර්ධන ක්‍රියාවලියේ දැවැන්ත කොටස්කරුවෙකු බවට පත් වෙමින් මහ මාර්ග ඉදිකිරීම්, ගොඩනැගිලි ඉදිකිරීම්, උමං හා පාලම් ඉදිකිරීම්, වාරිමාර්ග හා ජල සම්පාදන යෝජනා ක්‍රම දියත් කරමින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වේගවත් සංවර්ධනයකට දායකත්වයක් ලබා දෙමින් අප අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් ආයතන විවිධ අභියෝග හමුවේ සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබන බව විශේෂයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

මෙම කාර්යයන් සාක්ෂාත් කර ගැනීමේ දී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා අප අමාත්‍යාංශයට නායකත්වය ලබා දෙන ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාට, අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය මෙන්ම අමාත්‍යාංශයේ අරමුණු ළඟාකර ගැනීමට කැපවීමෙන් කටයුතු කරන සියලුම ආයතන ප්‍රධානීන් හා සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**ඉන්දික බණ්ඩාරනායක(පා.ම)**
**නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍ය**

## ලේකම්තුමියගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, නව රජයේ ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් 2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩ සටහන් ඇතුළත් 2015 වර්ෂයේ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි.

2015 වසර අභියෝගාත්මක වසරක් විය. නව රජය යටතේ අමාත්‍යාංශයේ නව අමාත්‍යවරයා ලෙස ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා හා නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස ගරු ඉන්දික බණ්ඩාරනායක මැතිතුමා වැඩ භාරගත් අතර එතෙක් සිදුකරන ලද සියලුම සංවර්ධන වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳ පූර්ණ සමාලෝචනයක් සිදු කොට ඉදිරි කටයුතු වඩාත් නිවැරදිව හා මනා කළමනාකාරීත්වයෙන් යුතුව සිදුකිරීමට පියවර ගන්නා ලදී.

නිවසක් නොමැති සෑම පවුලකටම නිවසක් හිමිකර දීමේ අරමුණ පෙරදැරිව ඉතා දිළිඳු මෙන්ම අඩු ආදායම්ලාභී ජනතාව වෙනුවෙන් නිවාස වැඩසටහන් කිහිපයක් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදී. ඒ අතර නව නිවාස ඉදිකිරීම්, නිවාස පිළිසකර කිරීම් සහ ඉපැරණි මහල් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම් ප්‍රධාන විය. එමෙන්ම, රජයේ කුළී නිවාසවල පදිංචිකරුවන්ට හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම මගින් ද නිවාසවල ජීවත්වීමේ අයිතිය තහවුරු කර ඇත.

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය කාර්යක්ෂම හා විශ්වසනීය කර්මාන්තයක් බවට පත්කිරීමේ අරමුණින් පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නා ලද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත ප්‍රකාරව කෙටුම්පත් කරන ලද ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය මේ වනවිට මහජන මත විමසුම සඳහා ඉදිරිපත් කර ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ සියලුම කාර්යයන් එක් තැනකින් නියාමනය කරමින් ඉදිකිරීම් ආයතන ශක්තිමක් කොට ශ්‍රී ලංකාවේ සිදුකෙරෙන වේගවත් සංවර්ධනයේ පාර්ශවකරුවන් වෙමින් වඩාත් ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවන් ලබා දීමට මෙමගින් හැකි වනු ඇත.

නිවාස සංවර්ධනය හා ඉදිකිරීම් කර්මාන්තයේ උන්නතිය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගනිමින්, අවශ්‍ය සම්පත් හා සහාය ලබා දෙමින් නිවැරදි කළමනාකාරීත්වයෙන් යුතුව සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා පූර්ණ කැපවීමෙන් අප කටයුතු කළෙමු. මෙම සියලු සාර්ථකත්වයන් අත්කර ගැනීම සඳහා නිවැරදි නායකත්වය ලබා දෙමින් නිරන්තර උපදෙස් ලබාදෙන ගරු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාටත්, නිරන්තර සහයෝගය ලබාදෙමින් දිරිගන්වන ගරු නියෝජ්‍ය අමාත්‍ය ඉන්දික බණ්ඩාරනායක මැතිතුමාටත් මාගේ ස්තූතිය පුදකරමි.

එසේම මෙම සියලු කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන අතිරේක ලේකම්වරුන් හා අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් ද, සංවර්ධන ක්‍රියාවලියට සෘජුවම දායකවෙමින් කැපවීමෙන් කටයුතු කරන අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතනවල ආයතන ප්‍රධානීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලවලට ද මාගේ ස්තූතිය පිරිනමමි.

**ඩබ්:කේ.කේ.අතුකෝරල**
**ලේකම්,**
**නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | හැඳින්වීම | 1-2 |
| 02. | අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 3-3 |
| 03. | අමාත්‍යාංශයේ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්<br>3.1. අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් | 3-4 |
| 04. | අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | 5-5 |
| 05. | අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය | 6-7 |
| 06. | අමාත්‍යාංශයේ ව්‍යුහය<br>6.1. පාලන අංශය<br>6.2. සැලසුම් අංශය<br>6.3. නිවාස අංශය<br>6.4. තාක්ෂණ අංශය<br>6.4.1. ඉංජිනේරු සේවා අංශය<br>6.4.2. ඉදිකිරීම් තාක්ෂණ අංශය<br>6.4.3. නාගරික ජනාවාස සංවර්ධන අංශය<br>6.5. ජාතික නිවාස කොමසාරිස් අංශය<br>6.6. මූල්‍ය අංශය<br>6.7. අභ්‍යන්තර විගණන අංශය | 8-12 |
| 07. | අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන<br>7.1. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>7.2. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය<br>7.3. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය<br>7.4. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව<br>7.5. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>7.6. රජයේ කර්මාන්තශාලාව<br>7.7. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව<br>7.8. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය<br>7.9. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව<br>7.10. ඕෂන් විව් සංවර්ධන පුද්ගලික සමාගම | 14-16 |
| 08. | මූල්‍ය ප්‍රතිපාදන | 18-19 |
| 09. | වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රගතිය<br>9.1. පාලන අංශය<br>9.2. සැලසුම් අංශය<br>9.3. නිවාස අංශය<br>9.4. තාක්ෂණ අංශය<br>9.5. ජාතික නිවාස කොමසාරිස් අංශය<br>9.6. අභ්‍යන්තර විගණන අංශය | 20-26 |
| 10. | අමාත්‍යාංශය මුහුණපාන ලද අභියෝග | 28-30 |

# 01. හැඳින්වීම

“තිරසර ජනාවාස සංවර්ධනයක් හා ඉදිකිරීම් කර්මාන්තයේ පුනර්ජීවයක්” යන දැක්ම ඔස්සේ නව රජයේ ප්‍රතිපත්තිවලට අනුව 2015 වර්ෂයේ දී නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන ප්‍රතිනිර්මාණය විය. නිවාස සංවර්ධනය යනු රටේ පොදු ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයෙහි වර්ධනීය ප්‍රතිඵල පෙන්නුම් කරන ප්‍රමුඛතම ක්ෂේත්‍රයකි. මේ සඳහා සුවිශේෂී වැඩසටහන් හා යටිතල පහසුකම් ව්‍යාපෘති කිහිපයක් හඳුන්වා දීමට හැකි වූ අතර, ඒවා සාර්ථකව දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර මේ වන විට එහි සාර්ථක ප්‍රතිඵල අත්කර ගනිමින් සිටී. අඩු ආදායම්ලාභී ප්‍රජාව, නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත්වන ප්‍රජාව, යුද්ධයෙන් අවතැන්වූවන්, වතු ජනතාව හා මධ්‍යම පාන්තිකයින් ඇතුළු සියලුම ජන කොටස් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ.

නව රජයේ දින 100 වැඩසටහනට සමගාමීව “සැමට සෙවණ” නිවාස වැඩසටහන ආරම්භ විය. තමා වෙනුවෙන්ම සැකසුනු නිවාසයක් නොමැති පවුල් 50,000ක් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාවට නැංවේ.මෙම වැඩසටහනේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ ජනතාවගේ සහභාගීත්ව සංවර්ධනය සැබෑලෙසින් මෙම වැඩසටහන සඳහා යොමු කර ගැනීමට හැකිවීමයි. එසේම, මෙම වැඩසටහන නිවසක් ඉදිකර දීමෙන් පමණක් නොනවතින අතර, අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ලෙස ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, 80 දශකයේ ක්‍රියාවට නැංවූ ආදර්ශ ගම්මානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කර එම ජනතාවගේ ජන ජීවිතය නංවාලීමේ නව වැඩසටහනක් ආරම්භ කිරීමට හැකි විය. එමෙන්ම, මෙම වසරේ ලෝක ජනාවාස දිනයට සමගාමීව දිවයින පුරා පවතින කපරාරුවෙන් පිළියම් නොවූ නිවාස නිමවුම් මට්ටමට පත්කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක විය. එමගින් ස්ථිර ආදායම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් 25,000කට සෙත සැලසිනි.

නිවාස නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවසක හිමිකම ලබා දීමේ අරමුණින් සැමට සෙවණ ආදර්ශ ගම්මාන වැඩසටහන ආරම්භ කිරීමට හැකි වූ අතර, ඒ තුළින් දිවයිනේ බොහෝ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි නිවාස 25 බැගින් වන නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

මධ්‍යම පාන්තිකයන් සඳහා නිවාස ලක්ෂ 05ක් ඉදිකිරීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත අතර එහි ප්‍රථම අදියරේ දී රජය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු නිවාස සංවර්ධනයට සුදුසු ඉඩම් තෝරා ගැනීමට සැලසුම් කර ඇත. ඒ යටතේ කළුතර, ගම්පහ, නුවර, ගාල්ල, කොළඹ යන දිස්ත්‍රික්කවල මධ්‍යම පාන්තික ජනවතාවට මිල දී ගැනීමට හැකියාව පවතින නිවාස ඉදිකිරීමට සැලසුම් කර ඇත.

එසේම, නාගරික ජනාවාසවල ජීවත්වන ජනතාව ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් බල ගැන්වීම අරමුණු කර ගනිමින් ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කරමින් ප්‍රජාවගේ කුසලතා, ආකල්ප වර්ධන වැඩසටහන් සහ ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් කොළඹ නගරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන අතර, ඔවුන් ආර්ථික සංවර්ධනයේ සාර්ථක පාර්ශවකරුවන් බවට පත්කිරීමේ මහඟු කාර්යභාරයක් ඉටුකරමින් පවතී.

එපමණකින් නොනැවතුන මෙම අමාත්‍යාංශය නිවාස සංවර්ධනයට සමගාමීව රජයේ නිවාසවල පදිංචිකරුවන්ට සින්නක්කර ඔප්පු ප්‍රදානය කිරීම හා වසර 30කට වඩා පැරණි රජයේ නිවාස

යෝජනා ක්‍රම පිළිසකර කර එමගින් ජන ජීවිතය සුරක්ෂිත කිරීමට ද පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය, කලාපීය හා ගෝලීය වශයෙන් තරඟකාරීත්වයට පත් කිරීම හා කාර්යක්ෂමතාවය වැඩිකිරීම අරමුණු කරගනිමින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සම්මත කර ඒ සඳහා එවකට තිබූ ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය බවට ප්‍රතිනිර්මාණය විය. එම පනතේ ඇතුළත්ව ඇති පරිදි "ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තියක්" සකස් කළ යුතු අතර, එහි කෙටුම්පත් දැනටමත් සකස් කොට ඉදිරි කටයුතු කරමින් පවතී.

රටක් සංවර්ධනයේ දී ඉදිකිරීම් ක්ෂේත්‍රය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුවන ප්‍රසාරණය අනුව ශ්‍රම වෙළඳපල ද ප්‍රසාරණය වේ. කලාපීය හා ගෝලීය වශයෙන් ඇතිවන ප්‍රවණතාවයට හා දේශීය ශ්‍රම වෙළඳපොල සඳහා මානව සම්පත පරිපූර්ණ කිරීම වෙනුවෙන් උසස් ප්‍රමිතියකින් යුත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා ද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සුවිශේෂී දායකත්වයක් ලබා දෙමින් සිටී.

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධන ක්ෂේත්‍රය ඉතා වැදගත් ස්ථානයක් හිමිකර ගනී. මේ සඳහා අමාත්‍යාංශයට අනුබද්ධිත ඉදිකිරීම් ආයතන වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලාව හා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

මේ අනුව ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ක්‍රියාවලියේ පාර්ශවකරුවන් වෙමින් 2015 වර්ෂයේ දි අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර 2015 වර්ෂයට අදාල අමාත්‍යාංශයේ කාර්යය සාධනය පිළිබඳ වාර්තාව මෙහි අන්තර්ගත වේ.

## 02. අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

### දැක්ම

**"තිරසාර ජනාවාස සංවර්ධනයක් හා ඉදිකිරීම් කර්මාන්තයේ පුනර්ජීවයක්"**

### මෙහෙවර

**"ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින්, වෘත්තීයවේදීන් හා ශ්‍රම බලකාය හැකියාවන් හා සම්පත්වලින් සන්නද්ධ කරමින් සැලසුම්ගත පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් ඇති කිරීම හා ප්‍රජා සහභාගීත්වයෙන් මූලික පහසුකම් සහිත ජනාවාස බිහිකිරීම, අඩු ආදායම්ලාභී ජනතාව ආර්ථික, සමාජීය හා සංස්කෘතික අතින් සවිබලගැන්වීම තුළින් ආර්ථික සංවර්ධනයට දායක වීම"**

## 3. අමාත්‍යාංශයේ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති හා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අදාල ආයතන සඳහා මාර්ගෝපදේශ සැපයීම.

## 3.1. අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

### නිවාස ක්ෂේත්‍රය

01. අඩු ආදායම්ලාභීන් සහ විශේෂ ප්‍රජා කණ්ඩායම්ද ඇතුලුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

02. පරිසර හිතකාමී ලෙස වියදමට සරිලන ප්‍රතිලාභ ගෙන දෙන නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳව ග්‍රාමීය ජනතාවට මහපෙන්වීම.

03.නිවාස විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

### ඉදිකිරීම් ක්ෂේත්‍රය

01. ඉදිකිරීම් විෂයට අදාළ ප්‍රගතීන්, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම හා ඇගයීම.

02. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශක හා නියාමන සේවා සැපයීම සහ බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තුව පිළිබඳ පුහුණුව.

03.අදාල නීති රීති හා ප්‍රමිතිවලට අනුකූලව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය.

### ඉංජිනේරු ක්ෂේත්‍රය

01.රාජ්‍ය ආයතන සඳහා යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම.

02. රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම.


### පොදු පහසුකම් ක්ෂේත්‍රය

01. සභාධිපත්‍ය දේපළ කළමනාකරණ හා නියාමන කටයුතු

02. මහජන සභාධිපත්‍ය දේපළ ප්‍රතිසංස්කරණ කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම.

**නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

# 4. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය




ගණ.-ගණකාධිකාරී
නි. අ.-නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස. ලේ.-සහකාර ලේකම්
ස. අ.- සහකාර අධ්‍යක්ෂක

නී. නි.-නීති නිලධාරී
ප. නි.-පරිපාලන නිලධාරී
පරි.-පරිවර්තක
තො. තා. නි.- තොරතුරු තාක්ෂණ නිලධාරී

සං. නි.-සංවර්ධන නිලධාරී
තා.නි.- තාක්ෂණ නිලධාරී
ප්‍ර.ස.- ප්‍රමාණ සමීක්ෂක

ක. ස.- කළමනාකරණ සහකාර
රි.- රියදුරු
කා. කා. ස.- කාර්යාල කාර්යය සහායක

# 5. අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය

| අනු අං. | | වැටුප් ක්‍රමය | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ලේකම් | SL 4 | | 01 |
| 02 | අතිරේක ලේකම්(පාලන හා මුදල්) | SL 3 | ශ්‍රී.ලං.ප.සේ.විශේෂ | 01 |
| 03 | අතිරේක ලේකම්(නිවාස හා සංවර්ධන) | SL 3 | ශ්‍රී.ලං.ප.සේ.විශේෂ | 01 |
| 04 | අතිරේක ලේකම්(කාර්මික) | SL 3 | ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01 |
| 05 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | SL 3 | ශ්‍රී.ලං.ග.සේ.විශේෂ | 01 |
| 06 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.1 | 01 |
| 07 | අධ්‍යක්ෂ (නිවාස හා සංවර්ධන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.1 | 01 |
| 08 | අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01 |
| 09 | අධ්‍යක්ෂ (සැලසුම්) | SL 1 | ශ්‍රී.ලං.ක්‍රම.සේ.1 | 01 |
| 10 | අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01 |
| 11 | අධ්‍යක්ෂ(නාගරික ජනාවාස සංවර්ධන) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01 |
| 12 | නිවාස කොමසාරිස්<br>ප්‍රධාන ගණකාධිකාරී | SL 1<br>SL 1 | -<br>ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01<br>01 |
| 13 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (නිවාස හා සංවර්ධන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.11/111 | 02 |
| 14 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.11/1,11/11 | 01 |
| 15 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | SL 1 | ශ්‍රී.ලං.ක්‍රම.සේ.11/1,11/11 | 01 |
| 16 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධියක්ෂ (සැලසුම්) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.11/1,11/11 | 01 |
| 17 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.11/1,11/11 | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 18 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (නාගරික ජනාවාස සංවර්ධන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.11/111 | 01 |
| | | | ශ්‍රී.ලං.ඉ.සේ.11/11 | 01 |
| 19 | සහකාර ලේකම්(පාලන ) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.111 | 02 |
| 20 | ගණකාධිකාරි | SL 1 | ශ්‍රී.ලං.ග.සේ.11/1,11/11 | 02 |
| 21 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SL 1 | ශ්‍රී.ලං.ග.සේ.1 | 01 |
| 22 | නීති නිලධාරි | SL 1 | දෙපාර්තමේන්තුගත | 01 |
| 23 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | SL 1 | ශ්‍රී.ලං.තො.තා.සේ.2/II | 01 |
| 24 | පරිපාලන නිලධාරී | MN7 | රා.ක.ස.සේ.(අධි) | 01 |
| 25 | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්(තාවකාලික තනතුරකි ) | -- | -- | 01 |
| 26 | භාෂා පරිවර්තක | MN6 | භාෂා පරිවර්තක සේවය | 02 |
| 27 | අයවැය සහකාර | MN4 | ආශ්‍රිත නිලධාරි | 01 |
| 28 | සැපයුම් සහකාර | MN4 | ආශ්‍රිත නිලධාරි | 01 |
| 29 | සංවර්ධන සහකාර | MN4 | ආශ්‍රිත නිලධාරි | 25 |
| 30 | නිවාස සංවර්ධන සහකාර | MN4 | ආශ්‍රිත නිලධාරි | 11 |
| **31** | සංවර්ධන නිලධාරී | MN4 | ආශ්‍රිත නිලධාරි | 19 |
| 32 | කළමනාකරණ සහකාර | MN4 | රා.ක.සේ. | 43 |
| 33 | කාර්මික නිලධාරි | MT2 | ශ්‍රී.ලං.තා.සේ. | 05 |
| 34 | ප්‍රමාණ සමීක්ෂක | MT2 | ශ්‍රී.ලං.තා.සේ. | 01 |
| 35 | රියදුරු | PL3 | රියදුරු සේවය | 22 |
| 36 | කාර්යාල කාර්ය සහයක | PL1 | කා.කා.සේ | 22 |
| **මුළු තනතුරු සංඛ්‍යාව** | | | | **182** |

## 6. අමාත්‍යාංශයේ ව්‍යුහය



## 6.1.පාලන අංශය

"නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදීත්, මහජන සුභසිද්ධිය පිණිස සිදු කරනු ලබන විවිධ කර්තව්‍යයන්හීදිත්, අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා සහය ලබා දීමත් ඒ සඳහා අවශ්‍ය වැඩ පරිසරය සකස් කිරීම, මානව සම්පත් මෙන්ම භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම පාලන අංශය මඟින් සිදු කරනු ලබයි."

### පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ සේවය කරන සියලුම නිලධාරීන්ගේ ආයතනික කටයුතු පවත්වාගෙන යාම.
2. අමාත්‍යාංශයේ සියලුම නඩත්තු කටයුතු සිදුකිරීම.
3. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු ඉටුකිරීම.
4. අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුකරන සියලුම පරිපාලන කටයුතු.
5. අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය සම්බන්ධ කටයුතු.
6. අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම.
7. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
8. ඵලදායිතා ක්‍රියාකාරකම් පැවැත්වීම.
9. අමාත්‍යාංශයේ කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම.
10. අමාත්‍යාංශ නිලධාරීන් සඳහා පුහුණු සැසි පැවැත්වීම.

## 6.2.සැලසුම් අංශය

"අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් සැලසුම්කල පරිදි ප්‍රගතිය ලඟාකර ගැනීම සඳහා මෙහෙයවීමට සහාය වීම."

"නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම මගින් අදාල පාර්ශව හා මහජනතාව දැනුවත් කිරීම."

"නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතනවලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මඟින් අනුමත කරවා ගැනීමට සහාය වීමත් සැලසුම් අංශය මගින් සිදු කරනු ලබයි."

### සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ දැක්ම හා අරමුණුවලට අදාලව අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතනවල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු.
2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මාසික හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඇගයීම.
3. අයවැය විවාද කාරක සහා අවස්ථාව වෙනුවෙන් අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
4. සංවර්ධන වැඩසටහන් සම්බන්ධ තොරතුරු සම්පාදනය හා වාර්තාකරණය.
5. අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනවල ව්‍යාපෘති යෝජනා, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය.

## 6.3.නිවාස අංශය

"නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ලඟා කර ගැනීම සඳහා නිවාස සංවර්ධන හා පොදු පහසුකම් යන විෂය ක්ෂේත්‍රයන් යටතේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම,මෙහෙයවීම, පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සඳහා මඟ පෙන්වීම. මෙම අංශය මඟින් සිදුකරනු ලබයි."

### නිවාස අංශයේ ප්‍රධාන කාර්යයන්

1. **ප්‍රතිපත්ති සම්පාදනය**
   - නිවාස ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍යවන ප්‍රතිපත්ති සම්පාදනය
   - නිවාස ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රතිපත්ති අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධ වී ක්‍රියාත්මක කරවීම.
   - අඩු පහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම හා ප්‍රජාව සංවර්ධනය කිරීම.
   - දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ගැමි නිවාස කමිටු ස්ථාපිත කිරීම.
   - ලෝක ජනාවාස දිනයට සමගාමීව දිවයින පුරා නිවාස ඉදිකිරීම් හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ලෝක ජනාවාස දිනය සැමරීම.
2. **ඉඩම් රාජකාරි**
   - **නිවාස සංවර්ධන අරමුණු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම / පවරා ගැනීම සම්බන්ධ කටයුතු.**
   - **නිවාස අරමුණු සඳහා ඉඩම් බැහැර කිරීම සම්බන්ධ කටයුතු.**
   - **ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනතේ 8(1) වගන්තිය යටතේ ඉඩම්/නිවාස වල නීතිමය අයිතිය ජනතාවට බැහැර කිරීම.**
   - **ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම්වල අනවසරයෙන් නිවාස ඉදිකර පදිංචි වී ඇති පදිංචිකරුවන්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව නියමානුකූල කිරීම.**
3. **නිවාස සංවර්ධනය**
   - **රටේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි නිවාස ඉදිකිරීම් වැඩසටහන් හා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**
   - **මහල් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම.**
   - **නිවාස ණය ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**
   - **නිවාස යෝජනා ක්‍රමවලට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.**
   - **වෙනත් රාජ්‍ය ආයතන හා ඒකාබද්ධ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**
   - **දේශීය හා විදේශීය ආයෝජකයින් සමග නිවාස ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.**
   - **අඩුපහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම හා ප්‍රජාව නගා සිටුවීම.**

## 6.4.තාක්ෂණ අංශය

### 6.4.1. ඉංජිනේරු සේවා අංශය

"ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා සාධාරණ හා දැරිය හැකි මිල ගණන් නියම කිරීම තුළින් සමස්ත ඉදිකිරීම් කර්මාන්තයේ, මූළ ඉදිකිරීම් පිරිවැය පාලනය කිරීමත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා විනිවිද භාවයකින් යුතුව සාධාරණ මිල ගණන් අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට සහාය වීමත් මෙම අංශය මගින් සිදු කරනු ලබයි."

### ඉංජිනේරු සේවා අංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජයේ ආයතනවල ඉදිකිරීම් සම්බන්ධ ස්ථාවර තාක්ෂණ කමිටු අනුමැතීන් ලබා දීම.

2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.
3. කොන්ත්‍රාත් විචලනයන් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීම.
4. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණ ලබා දීම.
5. කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධව ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල දත්ත පද්ධති හා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල මිල ගණන් පිළිබඳ දත්ත පද්ධති පවත්වා ගෙන යාම.

### 6.4.2. ඉදිකිරීම් තාක්ෂණ අංශය

"පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් ඇති කිරීමට අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මෙහෙයවීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි."

#### ඉදිකිරීම් තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන්

1. ඉදිකිරීම් අංශයට අනුබද්ධිත ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා සපයන ආයතන ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා මෙහෙයවීම.
2. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම බලකාය සූදානම් කිරීම.
3. වෘත්තීයවේදීන් හා ඉදිකිරීම් ශිල්පීන් නිපුණතාවයෙන් හා දැනුමෙන් පූර්ණ කිරීමට හා ගුණාත්මක ඉදිකිරීම් සිදු කිරීමට අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මෙහෙයවීම.

### 6.4.3. නාගරික ජනාවාස සංවර්ධන අංශය

"ප්‍රධාන වශයෙන් නාගරික ප්‍රදේශයන්හි වාසය කරනු ලබන අඩු ආදායම්ලාභී ජනතාවට හා අනෙකුත් ජනතාවට අවශ්‍ය පරිදි පදිංචි වීමට හැකියාව පවතින, පහසුකම්වලින් සමන්විත නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් මෙහෙයවීම හා නාගරික ජනාවාස සංවර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි."

#### නාගරික ජනාවාස සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන සංවර්ධන යෝජනාව අමාත්‍යාංශ ස්ථාවර ව්‍යාපෘති ඇගයීම් කමිටුව හරහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
2. නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

## 6.5.ජාතික නිවාස කොමසාරිස් අංශය

මෙම අංශය මඟින් 1973 අංක 01 දරණ නිවාස දේපල උපරිමය නීතිය යටතේ ලබා දී ඇති බලතල හා කාර්යයන් ඉටු කරයි. එමෙන්ම 1972 අංක 7 දරණ කුලී පනත යටතේ පැවරී ඇති කාර්යයන් ද ඉටු කරනු ලබයි.

"ඉහත දක්වා ඇති අණපනත් මගින් ඉටුකිරීමට අපේක්ෂිත ප්‍රධාන අරමුණ වන කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම, රජයට පවරා ගත් නිවාසවල අයිතිකරුවන්ට වන්දි ලබා දීම වැනි ඉලක්ක සපුරා ගැනීමට මෙම අංශය විසින් ක්‍රියා කරනු ලබයි."

## 6.6. මූල්‍ය අංශය

"අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාල වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හා උපදේශනය ලබා දීමත්, එම සම්පත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍යවන පද්ධති හා පාලන ක්‍රම පිළිබඳව උපදෙස් ලබා දීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. "

## මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අරමුදල් පිළිබඳ සැලසුම් කිරීම.
2. අයවැයකරණය.
3. අරමුදල් නිසි ප්‍රමාණයට, නිසි වේලාවට ලබා ගැනීම.
4. අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් නිකුත් කිරීම හා වියදම් කිරීම.
5. අදාල පාර්ශවයන් වෙත වියදම හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව නියමිත දිනයන්ට හෝ ඊට පෙර වාර්තා කිරීම.

# 6.7.අභ්‍යන්තර විගණන අංශය

"ආයතනයන්හි අපේක්ෂිත අරමුණු යථාර්තයක් බවට පත් කර ගැනීම පිණිස යහපත් මූල්‍ය පරිපාලනයක් සහ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම. මෙම අංශය මගින් සිදු කරනු ලබයි."

අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය පරිපාලනය හා කළමනාකරණ කටයුතුවලට සහභාගි වී එම කටයුතු වඩාත් විධිමත්ව සහ කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුකිරීම පිණිස, කළමනාකරණයට මඟ පෙන්වීමෙන් සහ අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් සහායවීම ද මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

# 2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්



"සැමට සෙවණ" ණය වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ණය ප්‍රදානය කිරීම



"සැමට සෙවණ" නිවාස ණය හා පෙදරේරු කට්ටල ප්‍රදානය කිරීම



පොළොන්නරුව "කලහගල" නිවාස ව්‍යාපෘතිය



හම්බන්තොට දිස්ත්‍රික්කයේ "සහනගම" ආදර්ශ ගම්මානයේ ඉදිකිරීම් කටයුතු




සිමෙන්ති ආධාර ලබාදීම - කුරුණෑගල දිස්ත්‍රික්කය



සිමෙන්ති ආධාර ලබාදීම - අනුරාධපුර දිස්ත්‍රික්කය

# 7.අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන

## 7.1.ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ස්ථාපිත කර ඇත.මෙම අධිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ නාගරික කාර්යාල 02 ක් මගින් දිවයින පුරා නිවාස ඉදිකිරීම් හා නිවාස සංවර්ධන ක්ෂේත්‍රයේ කටයුතු මෙහෙයවනු ලබයි.

## 7.2.නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත අනුව පිහිටුවන ලද මෙම අධිකාරිය විසින් තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවන බවට සහතික වීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මගින් හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් හා අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම මගින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා කටයුතු කරනු ලබයි.

## 7.3.සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතින් පිහිටුවනු ලැබූ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, සහාධිපත්‍ය ඉදිකිරීම් හා කළමනාකරණ සම්බන්ධ නියාමන අධිකාරිය වේ. තවද 1982 අංක 45, 2003 අංක 39 යන පනත්වලින් සංශෝධිත බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ නියමයන් නියාමනය කිරීම මෙම අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වේ.

## 7.4.රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන අර්ධ රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අංක 12841 දරණ 1962 ජනවාරි 01 වැනි දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ අනුමැතියෙන් සංස්ථාපනය කරන ලද ආයතනයකි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම ආයතනයකි. මෙමගින් ඉදිකිරීම් උපදේශන සේවා ලබාදීම, ඉදිකිරීම් සඳහා ඉංජිනේරු සේවා සැපයීම, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයීම, සැලසුම් නිර්මාණය කිරීම, පෙරසවි/පෙරදි කොන්ක්‍රීට් උපාංග නිෂ්පාදනය කිරීම, පුහුණුව ලබා දීම මෙන්ම පර්යේෂණ කටයුතු ද සිදු කරනු ලබයි.

එසේම,මෙම සංස්ථාව 2009 වසරේ සිට ISO 9001:2000 තත්ත්ව සහතිකයෙන් හා මෑත කාලයේ දී ISO 14001:2004 පරිසර කළමනාකරණ සහතිකයෙන් ද පිදුම් ලබා තරඟකාරීව ඉදිරි කටයුතු කරගෙන යනු ලබන ඉදිකිරීම් ආයතනයකි.

## 7.5.ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ආරම්භයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කොටසක් වශයෙන් පැවති මෙම ආයතනය 1969 දී “ඒ” ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරනු ලැබීය.එකල සියලුම රජයේ ගොඩනැගිලි සහ ඊට අදාල සේවාවන්ගේ ඉදිකිරීම් කටයුතු සහ නඩත්තු කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් අතර, එම සියලු කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල 27 ක් මගින් 598කට අධික ස්ථිර සේවකයින් පිරිසක් මගින් ඉටුකරනු ලැබීය.

වර්ෂ 1989 දී 13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභා වලට බලය පැවරීමත් සමඟ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය සහ මුළු දිවයිනම ආවරණය වන පරිදි පිහිටවනු ලැබූ ප්‍රධාන ඉංජිනේරු කාර්යාල 7ක් ලෙසට ප්‍රතිසංවිධානය විය.

## 7.6.රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ආයතන සඳහා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ ලෝහ හා වඩු කර්මාන්ත ආශ්‍රිත වැඩ, භාණ්ඩ හා සේවා සැපයීමේ කාර්යයන් සහ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩහල පුහුණු කිරීමේ කටයුතු කරනු ලැබේ.

## 7.7.රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 ඔක්තෝම්බර් 01 වන දින ඉංජිනේරු සංවිධානයක් ලෙස ස්ථාපිත කරන ලද අතර, මේ වන විට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම සංස්ථාව ප්‍රධාන පෙළේ ඉංජිනේරු ආයතනයක් ලෙස පාලම් හා මාර්ග, ගොඩනැගිලි, උමං, වාරිමාර්ග හා ජල සම්පාදන යෝජනා ක්‍රම යනාදිය සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා ඉදිකිරීම් තුළින් මෙරට යටිතල පහසුකම් සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් සපයන අතර පාලම් ඉදිකිරීම් සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම ආයතනයක් ද වෙයි. එසේම උමං ඉදිකිරීමට හැකියාවක් ඇති එකම ශ්‍රී ලාංකික ආයතනය ද මෙම සංස්ථාවයි.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් මෙම සංස්ථාව C1 ශ්‍රේණියේ ඉදිකිරීම් ආයතනයක් ලෙස ලියාපදිංචි කර ඇති අතර, එම ආයතනය මගින් පිරිනමන ලද, ඉදිකිරීම් කාර්යය සාධනය පිළිබඳ සම්මානයද දිනා ඇත.

ISO 9001:2008 තත්ත්ව සහතිකය ද හිමිකර ගෙන ඇති මෙම සංස්ථාව ඉදිකිරීම් නියමිත ප්‍රමිතියට අනුව සිදු කරනු ලබයි.

මෙම සංස්ථාව ඉංජිනේරුමය කාර්යයන් සඳහා අවශ්‍ය පෙරසවි(පෙරදි) කොන්ක්‍රීට් පාලම්, බාල්ක, විදුලි කණු සහ අනෙකුත් සියලුම පෙරසවි(පෙරදි) කොන්ක්‍රීට් නිෂ්පාදනය කරනු ලබයි. මීට අමතරව, මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම මාර්ග සංඥා පද්ධති නඩත්තු කිරීම සහ නව පද්ධති සවිකිරීම ද මෙම සංස්ථාව මගින් සිදු කරනු ලබයි.

## 7.8.ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය.

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාරව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය බවට පරිවර්තනය කර ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණු වේ.

මෙම පනත යටතේ ඉදිකිරීම් කර්මාන්ත සඳහා ජාතික උපදේශක සභාවක් පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තිකයින්, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුබසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිසද, ඉදිකිරීම් කටයුතුවලට අදාල ආරවුල් නිරවුල් කිරීම සහ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ද විධිවිධාන සලසා ඇත.

මෙම පනතෙහි සඳහන් පරමාර්ථ හා කාර්යයන් මේ වනවිට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.

## 7.9. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වෙළඳ සංස්ථා පනත යටතේ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව 1971 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. අනතුරුව 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ 1992 වර්ෂයේ සැප්තැම්බර් මසදී සමාගම් පනත මගින් සීමිත වගකීම් සහිත පොදු සමාගමක් බවට පරිවර්තනය කරන ලදී.

නිවාස හා යටිතල පහසුකම් සැපයීමේ ක්ෂේත්‍රයට අවශ්‍ය ප්‍රමිතිගත ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපකරණ තරඟකාරී මිලකට දිවයින පුරා සපයමින් ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ සැපයීමේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස සමාජ වගකීම් ඉටුකරමින් ශ්‍රී ලාංකේය ප්‍රජාව තුළ උපරිම විශ්වාසනීයත්වයක් ගොඩනගා ගනිමින් සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සිය කටයුතු මෙහෙයවනු ලබයි.

## 7.10.ඕෂන් ව්‍යූ සංවර්ධන පුද්ගලික සමාගම

1996 ජනවාරි මස 01 වැනි දින ඕෂන් ව්‍යූ සංවර්ධන පුද්ගලික සමාගම ආරම්භ කරනු ලැබීය.

"ජනසෙවණ" නිවාස දසලක්ෂයේ ජාතික ප්‍රතිපත්තියට සවිය දෙන රාජ්‍ය සමාගමක් ලෙස විශ්වාසය හා වගකීමත්, පුද්ගලික ආයතනයක් ලෙස කාර්යක්ෂමතාවයත් පෙරදැරි කරගත් මෙම සමාගම අද වන විට නිවාස වෙළඳපොළෙහි පැහැදිලි වෙනසක් ඇති කරමින් නිවාස අවශ්‍යතාවය සපුරාලීමට ඉදිරිපත්ව සිටී.

# 2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්



“සහස්පුර” මහල් නිවාස සංකීර්ණය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය



අතුරුගිරිය අධිවේගී මාර්ග අන්තර් හුවමාර මධ්‍යස්ථානය




“හිල්ඩා” නිවාස යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය



ආලෝකපුර නිවාස යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය




ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ශිල්පීන් පුහුණු කිරීම- OTC ගල්කුලම



කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

# 8. මූල්‍ය ප්‍රතිපාදන

2015 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද සමස්ත මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය හා එම මූල්‍ය ප්‍රතිපාදනයන්හි 2015.12.31 දිනට ප්‍රගතිය පහත දක්වා ඇත.

## ❖ අමාත්‍යාංශයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ශුද්ධ(දළ) ප්‍රතිපාදන | තථ්‍ය වියදම |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 638,960,000 | 643,190,000 | 628,675,474 |
| ප්‍රාග්ධන වියදම් | 4,385,690,000 | 5,716,690,000 | 5,691,112,092 |
| | **5,024,650,000** | **6,359,880,000** | **6,319,787,566** |
| | | | |

## ❖ වැඩසටහන් අනුව

වැඩසටහන් 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ශුද්ධ(දළ) ප්‍රතිපාදන | තථ්‍ය වියදම |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 538,460,000 | 537,460,000 | 522,945,474 |
| ප්‍රාග්ධන වියදම් | 14,400,000 | 15,400,000 | 12,638,466 |
| | **552,860,000** | **552,860,000** | **535,583,940** |
| | | | |

වැඩසටහන් 2 - සංවර්ධන ක්‍රියාකාරකම්

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ශුද්ධ(දළ) ප්‍රතිපාදන | තථ්‍ය වියදම |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 100,500,000 | 105,730,000 | 105,730,000 |
| ප්‍රාග්ධන වියදම් | 4,371,290,000 | 5,701,290,000 | 5,677,899,526 |
| | **4,471,790,000** | **5,807,020,000** | **5,783,629,526** |
| | | | |

# රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

**විෂය අංක** 123011
123012

| | උපරිම හර සීමාව | අවම බැර සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| **අනුමත සීමාවන්** | 15,000,000 | 7,000,000 | 50,000,000 |

| | | |
|---|---|---|
| **වර්ෂය ආරම්භයේ ශේෂය (2015.01.01)** | | 23,645,514 |
| **වර්ෂය තුළ මුළු හර කිරීම්** | | |
| 123011 | 7,690,540 | |
| 123012 | 16,429,120 | 24,119,660 |
| | | 47,765,174 |
| **වර්ෂය තුළ මුළු බැර කිරීම්** | | |
| 123011 | 8,394,882 | |
| 123012 | 16,982,978 | (25,377,860) |
| **වර්ෂය අවසාන ශේෂය (2015.12.31)** | | 22,387,314 |

# 9. වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රගතිය

## 9.1. පාලන අංශය

* **අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය**

2015 වර්ෂයේ මුල් කාලයේදි ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වශයෙන් පැවති මෙම අමාත්‍යාංශය නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය ලෙස ප්‍රතිව්‍යුහගතවීමත් සමග එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන ලද ග්‍රාමීය සංවර්ධන හා දිවි නැගුම යන අංශවලට අයත් මාණ්ඩලික නිලධාරීන් 42ක් ඇතුළුව නිලධාරීන් 88 දෙනෙකුගෙන් යුක්ත වූ කාර්යය මණ්ඩලයක් අමාත්‍යාංශයේ පරිපාලනය යටතට පත්විය. ඒ අනුව අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලය නිලධාරීන් 246ක් දක්වා වර්ධනය විය.

එහිදී පාලන අංශයේ පැවති මානව සම්පත් හා භෞතික සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරගනිමින් උක්ත කාර්යය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු, රාජකාරි උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම් ආදී සියලු කටයුතු පාලන අංශය මඟින් කිසිදු ප්‍රමාදයකින් තොරව සිදු කරන ලදී. මීට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ලද සහකාර අධ්‍යක්ෂවරු, සංවර්ධන සහකාරවරු හා ආර්ථික සංවර්ධන නිලධාරීන් 20,000කට ආසන්න ප්‍රමාණයක් මෙම අමාත්‍යාංශයට අන්තර්ග්‍රහණය කරන ලද අතර එකී නිලධාරීන් හා සම්බන්ධ සියලු පරිපාලනමය වගකීම්ද මෙම අමාත්‍යාංශය යටතට පත්විය. එම නිලධාරීන් සම්බන්ධව සියලු පරිපාලන කටයුතු පවත්නා මානව සම්පත මගින් ඇඩි පරිශ්‍රමයකින් නොපිරිහෙලා ඉටු කිරීමට පාලන අංශය කටයුතු කරනු ලැබිය.

2015 අගෝස්තු මස පැවති මහ මැතිවරණයෙන් පසුව නැවත වරක් මෙම අමාත්‍යාංශය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ලෙස ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද අතර සමෘද්ධි විෂය පථය ඉවත් වීමත් සමග 2015 වර්ෂය මුල් භාගයේදී අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන් 88 සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධක අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලද අතර එම හේතුවෙන් අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය වර්ෂය අවසාන වන විට 162 ක් දක්වා අඩු විය.

* **අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු**

අමාත්‍යාංශයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු වශයෙන් සැලකෙන අතිරේක ලේකම්(නිවාස හා සංවර්ධන), ජාතික නිවාස කොමසාරිස්, සහකාර අධ්‍යක්ෂ(නිවාස) යන තනතුරු 2015 වර්ෂය තුළ පුරප්පාඩු වූ අතර එම පුරප්පාඩු 2015 වර්ෂය තුළදී සම්පූර්ණ කර ගැනීමට හැකියාව ලැබුණි. තවද 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ(නාගරික ජනාවාස සංවර්ධන) හා භාෂා පරිවර්තක තනතුරුද 2015 වර්ෂයේදී සම්පූර්ණ කර ගැනීමට අමාත්‍යාංශයට හැකිවිය.

එසේ වුවත් පුරප්පාඩුව පැවති ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් ද, ප්‍රමාණ සමීක්ෂණ තනතුර බඳවා ගැනීම් පරිපාටියෙහි සුදුසුකම් සංශෝධනය කිරීම සඳහා නැවත යොමු කිරීම හේතුවෙන්ද සම්පූර්ණ කර ගත නොහැකි වූ අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරෙහි පුරප්පාඩුවද සම්පූර්ණ කළ නොහැකි විය.

තවද අමාත්‍යාංශයේ ද්විතීය හා ප්‍රාථමික ශ්‍රේණිවලට අයත් නිලධාරීන් මියයාම, ස්ථාන මාරුවීම හා විශ්‍රාම යාම හේතුවෙන් තනතුරු 07ක් පුරප්පාඩු විය. ඒ අනුව 2015 වර්ෂය අවසන් වන විට පැවති සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 24කි.

* **අමාත්‍ය මණ්ඩල සංදේශ හා පාර්ලිමේන්තු ප්‍රශ්න**

නිවාස, සමෘද්ධි හා ඉදිකිරීම් යන විෂය පථයන්ට අයත් අමාත්‍යාංශ යටතට ගැනෙන අනුබද්ධිත ආයතන වල ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි විවිධ සංවර්ධන හා පරිපාලනමය කටයුතුවලට අදාලව 2015 වර්ෂයේදී මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 51 ක් ඉදිරිපත් කර ඇත. මීට අමතරව අමාත්‍ය මණ්ඩල සටහන් 14ක් යොමු කර ඇති අතර අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් සඳහා නිරීක්ෂණ ලබාදීමට ද අමාත්‍යාංශය විසින් කටයුතු කර ඇත.

මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කරුණු සම්බන්ධයෙන් 2015 වර්ෂය තුළදී පාර්ලිමේන්තු ප්‍රශ්න 26 ක් ඉදිරිපත් වී ඇති අතර එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලබා දීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදී.

* **මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම**

මෙම අමාත්‍යාංශයට අදාලව ප්‍රධාන වශයෙන් මහජන ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නිවාස ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන අතර සේවකයින්ගේ ආයතනික ගැටළු හා වෘත්තීය සමිති ගැටළු සම්බන්ධව පැමිණිලි ඉදිරිපත් වන අවස්ථා ද දක්නට ලැබේ. විශේෂයෙන් ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය හා මහජන පෙත්සම් කාරක සභාව හරහා ද ඉහත ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි.

මෙම සියලු ඉල්ලීම් සඳහා මැදිහත් වී කටයතු කිරීමට අමාත්‍යාංශය නොපමාව කටයුතු කර ඇති අතර ආයතනික හා වෘත්තීය සමිති ගැටළු සඳහා අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් අදාල පාර්ශවයන් සමග සාකච්ඡා පවත්වා විසඳුම් ලබාදීමට කටයුතු කර ඇත.

* **පුහුණු හා ඵලදායිතා ක්‍රියාකාරකම්**

අමාත්‍යාංශය විසින් රාජ්‍ය පරිපාලන, ගිණුම් කටයුතු, ආයතනික කටයුතු, ඵලදායිතා ක්‍රියාකාරකම්, පෞරුෂත්වය සංවර්ධන හා ධාරිතා සංවර්ධන වැනි හඳුනාගත් පුහුණු වැඩසටහන් සඳහා මාණ්ඩලික නිලධාරීන් ඇතුළු විවිධ නිලධාරී කාණ්ඩ ආවරණය වන පරිදි නිලධාරීන් සහභාගී කර ඇති අතර අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලය සඳහා ආකල්ප හා ධාරිතා සංවර්ධන වැඩසටහන් දෙකක් 2015 වර්ෂය තුළ පැවැත්වීමට කටයුතු කරන ලදී.

තවද රජයේ හා අනුබද්ධිත ආයතනවල තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලා හදාරන ලද අභ්‍යාසලාභීන් 15 දෙනෙකු සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීමට 2015 වර්ෂය තුළ අමාත්‍යාංශය කටයුතු කර ඇත.

## 9.2. සැලසුම් අංශය

* **වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම හා ප්‍රගති සමාලෝචන රැස්වීම්**

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතනවල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතිවලට අදාල ක්‍රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2015 වර්ෂය සඳහා ද අමාත්‍යාංශයේ මෙන්ම ඊට අනුබද්ධිත ආයතනවලට අදාල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලදී.

වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණයට හා ඇගයීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 10 ක් 2015 වර්ෂයේදී පවත්වන ලද අතර, ප්‍රධාන වශයෙන් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව හා සඵලදායීව කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීමට එමඟින් හැකියාව ලැබුණි.

* **ප්‍රගති වාර්තා හා ව්‍යාපෘති යෝජනා**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්තුමය වශයෙන් 2015 වර්ෂයේදී ප්‍රගති වාර්තා 4 ක් සම්පාදනය කරන ලද අතර ඒවා අදාල ආයතන වෙත ඉදිරිපත් කරන ලදි. එසේම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද ව්‍යාපෘති හා

සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය අධීක්ෂණය කරනු ලබන අතර ඊට අදාල වූ ප්‍රගති වාර්තා 04ක්ද අමාත්‍යාංශය විසින් සකස් කර ඉදිරිපත් කර ඇත.

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මඟින් 2016 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ අරමුණින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්ට අදාලව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති යෝජනා 21 ක්, භාණ්ඩාගාර අරමුදල් ලබා ගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය සමත් විය.

- **අමාත්‍යාංශයේ ප්‍රගතිය හා ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව**

සෑම වර්ෂයක ම අයවැය විවාද කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන අමාත්‍යාංශයේ ප්‍රගතිය හා ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව මෙම වර්ෂයේ ද අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි ප්‍රගතිය හා ව්‍යාපෘති යෝජනා හා සැලසුම් ද සමඟින් සකස්කර නිසි කලට ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණි.

- **සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ආධාර ලබා ගැනීම**

අමාත්‍යාංශය විසින් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට නියමිත දැවැන්ත නිවාස වැඩ පිළිවෙලට ජපන් රජයේ සහ ජපන් අන්තර් ජාතික සහයෝගිතා ඒජන්සියේ(JAICA) සහයෝගය ලබා ගැනීම සඳහා ගරු අමාත්‍යතුමා සහ ශ්‍රී ලංකාවේ ජපන් තානාපති සමග විශේෂ සාකච්ඡාවක් 2015.09.18 දින පවත්වන ලදී. ඒ සඳහා ජපන් තානාපතිවරයාගේ ධනාත්මක ප්‍රතිචාර හිමි වූ අතර, එහිදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශේෂිත සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර ලබා ගැනීම සම්පබන්ධයෙන් ද අවධානය යොමු කරන ලදී.

## 9.3. නිවාස අංශය

- **ලෝක ජනාවාස දිනය**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1985 වසරේ වාර්ෂික සැසිවාරය තුළින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවකට අනුව 1986 වසරේ සිට පසුගිය වසර 28ක කාලය තුළ නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයට අදාලව විවිධ වූ තේමාවන් යටතේ ජනාවාස දින සැමරුම් සිදු කරනු ලැබීය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය සෑම වසරකම ඔක්තෝම්බර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය සැමරීම සිදු කරනු ලබන අතර 2015 වසරේ ඔක්තෝම්බර් මස 05 වන දින මෙවර ලෝක ජනාවාස දිනය යෙදී තිබිණි. "විවෘත භූමිය සැමට" (Public space for all) මෙවර ජනාවාස දින තේමාව විය. මෙම ජාත්‍යන්තර දින සැමරුම නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයේ වඩාත් ඵලදායී වැඩසටහනක් ලෙසින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජනතාවගේ මූලික අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කොළඹ නගරය මුල්කොටගෙන දිවයින පුරා විවිධ වූ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබීය.

මේ අනුව, මෙවර ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් එහි ප්‍රතිලාභ නිවාසලාභී ජනතාව වෙත ලබාදීම අරමුණු කර ගනිමින් ඔක්තෝම්බර් 05 වන දින සිට 12 වන දින දක්වා කාලය "ජනාවාස සතිය" ලෙසින් ප්‍රකාශයට පත්කරන ලදී. එහිදී එම සතිය තුළ විවධ තේමාවන් යටතේ ළමා දිනය, යොවුන් දිනය, ප්‍රජා දිනය, හිමිකම් දිනය, ශ්‍රමදාන දිනය හා නිවාස ව්‍යාපෘති දිනය යනුවෙන් නම් කරමින් අදාල දිනයන් තුළ දිස්ත්‍රික් මට්ටමින් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

ලෝක ජනාවාස දිනය ලොව පුරා ක්‍රියාවට නංවන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විෂයානුබද්ධ සංවිධානය වන එක්සත්

ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ ශ්‍රී ලාංකික නියෝජිත ආයතනය වන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සිය අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන, නිවාස හා ජනාවාස සංවර්ධනයට අනුගතව කටයුතු කරන සෙසු අමාත්‍යාංශ රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධානවල සහාය ලබාගනිමින් මෙවර ලෝක ජනාවාස දින ජාතික සැමරුම 2015 ඔක්තෝම්බර් 05 වන සඳු දින ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ 10, මාළිගාවත්ත නිවාස සංකීර්ණයේ දී පැවැත්විය. "විවෘත භූමිය සැමට" යන්න සාක්ෂාත් කරගනිමින් නිවාස සංකීර්ණයන් හි විවෘත කේන්ද්‍රස්ථාන අලංකරණය කිරීම සහ පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කරන ලදී.

මීට අමතරව, ජනාවාස දිනය නිමිතිකොට ගෙන විවිධ වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, දිවයිනේ විවිධ ප්‍රදේශවල බිත්ති කපරාරු නොකල නිවාස එක් දිස්ත්‍රික්කයකින් 1,000 බැගින් තෝරාගෙන එක් නිවසකට රු. 10,000/= ක වටිනාකමකින් යුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සපයා දිස්ත්‍රික්ක 25 ක නිවාස 25,000 ක් කපරාරු කිරීමේ දීප ව්‍යාප්ත ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවීය.

නිවාස වැඩසටහනට අනුව සියලුම දිස්ත්‍රික් ආශ්‍රිතව ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, චිත්‍ර තරඟ, කර්මාන්ත ආශ්‍රිත පුහුණු වැඩසටහන්, ශ්‍රමදාන, නව ව්‍යාපෘතිවල ඉදිකිරීම් ආරම්භ කිරීමේ වැඩසටහන් ඒ අතර විය. මෙවර ලෝක ජනාවාස දින සැමරුමේ දී ව්‍යාපාරිකයින් සිය ධන පරිත්‍යාග මගින් වැඩසටහන් වලට සම්බන්ධ වීම දිරිගැන්වීමක් විය.

### * ජතික නිවාස දිනය

නිවාසලාභීන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාවට නැංවූ ජාතික නිවාස වැඩසටහන 1979 ජුනි 23 වන දින ඇරඹී අතර, එය පසුකලෙක දීප ව්‍යාප්ත ජාතික නිවාස වැඩසටහනක් මෙන්ම සහභාගීත්ව නිවාස සංවර්ධනය ලොවට හඳුන්වා දීමට තරම් ප්‍රබල ව්‍යාපෘතියක් විය. එකී දිනයේ ඇති ජාතික වැදගත්කම අගය කරමින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සෑම වසරකම ජුනි 23 වන දින ජාතික නිවාස දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීම මෙම වසරේ දී සිදු විය. මෙවර ජාතික නිවාස දින උළෙල ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් තිස්සමහාරාමයේ දී පැවැත්විණි.

### * "හැබිටැට්" III ජාතික වාර්තාව සකස් කිරීම

නිවාස හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ තුන්වන සමුළුව (හැබිටැට් III) 2016 වසරේ දී පැවැත්වීමට නියමිතය. වසර 20කට වරක් පැවැත්වෙන මෙම සමුළුව එම සංවිධානයේ සාමාජිකත්වය දරණ සියලු රටවල, නිවාස හා නාගරික සංවර්ධනය පිළිබඳ ගරු මැති ඇමතිවරුන් හා අදාල රටවල රාජ්‍ය නායකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වේ.

ඉහත සමුළුව සඳහා හැබිටැට් සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව ඉතා ක්‍රියාශීලී සහභාගීත්වයක් පෙන්නුම් කර ඇත. 1996 වසරේ පැවති සමුළුවේ තේමාව වූයේ "සැමට නිවාස පහසුකම් සහ නාගරික මානව ජනාවාස සංවර්ධනය" යන්නයි.

ඉහත ජාතික වාර්තාව සැකසීම හා ඊට සමගාමීව ගත වූ වසර 10ක කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන්හි ප්‍රගතිය වාර්තා කිරීම, එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස සංවර්ධන වැඩසටහනේ ශ්‍රී ලාංකික නියෝජිත ආයතනය ලෙස නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ මූලික වගකීම වේ. හැබිටැට් III ජාතික වාර්තාව මේ වන විට සකස් කරමින් පවතී.

### * නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මෙම අමාත්‍යාංශය යටතේ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතනයන් වේ. ඒ අනුව මේ වසරේදී ක්‍රියාත්මක කරන

ලද නිවාස වැඩසටහන් අතර "සැමට සෙවණ" නිවාස වැඩසටහන, ආදර්ශ ගම්මාන වැඩසටහන, කපරාරු වැඩසටහන, "සම්පත් සෙවණ" වැඩසටහන හා ඉන්දියානු ආධාර නිවාස වැඩසටහන විශේෂ තැනක් ගනී.

ඉහත සඳහන් කරන ලද විශේෂිත නිවාස වැඩසටහන් අතරින් මෙම වසරේදී අපේක්ෂිත ඉල්ක්කගත නිවාස ඒකක ප්‍රමාණය 111,686 ක් වූ අතර වර්ෂය අවසානය වන විට නිවාස ඒකක 76,824ක වැඩ අවසන් කිරීමට හැකියාව ලැබුණි. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 66% කි. "සැමට සෙවණ" නිවාස වැඩසටහන යටතේ අපේක්ෂිත නිවාස ඒකක 50,000 අතරින් නිවාස ඒකක 41,180 ක වැඩ අවසන් කිරීමට අමාත්‍යාංශයට මෙම වසරේදී හැකියාව ලැබුණි.

ඉඩමක් හා නිවසක් අහිමි පවුල් ඉලක්කකොට ගනිමින් මෙම වසරේදී ක්‍රියාවට නැංවූ "ආදර්ශ ගම්මාන" නිවාස වැඩසටහන යටතේ රජයේ අරමුදල් යොදාගනිමින් ගම්මාන 38ක් හා පෞද්ගලික අංශයේ පරිත්‍යාගයක් යටතේ ගම්මාන 2ක් වශයෙන් නිවාස ඒකක 25කින් සමන්විත ගම්මාන 40ක වැඩ ආරම්භ කිරීමට හැකියාව ලැබුණි. එමගින් නව නිවාස ඒකක 1000ක් ශ්‍රී ලංකාවේ සමස්ත නිවාස ප්‍රමාණයට එක් කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම වසරේදී ක්‍රියාවට නැංවූ නිවාස වැඩසටහන් අතර "කපරාරු වැඩසටහන" ට සුවිශේෂී ස්ථානයක් හිමි විය. එමගින් දිවයිනේ සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි එක් දිස්ත්‍රික්කයකින් පවුල් ඒකක 1000ක් සඳහා ස්වකීය නිවාස පිළිසකර කර ගැනීම සඳහා සිමෙන්ති හා අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාදීම සිදු කරන ලදී. ඒ අනුව මෙම වසරේදී ඉලක්කගත පවුල් ඒකක 25,000 ඉක්මවා ප්‍රතිලාභ ලබාදීමට හැකියාව ලැබුණු අතර එසේ ප්‍රතිලාභ හිමි වූ පවුල් ඒකක ප්‍රමාණය 28673 ක් විය. මේ සඳහා වැය කරන ලද මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 250 කි.

තවද අවිච්ඡේද නිවාස වැඩසටහන යටතේ මෙම වසරේදී අපේක්ෂිත නිවාස ඒකක 10,116ක් අතුරින් නිවාස ඒකක 6492ක වැඩ අවසන් කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස ගත්කළ 64% ක් විය.

* **ඉඩම් නිවාස ඔප්පු ලබා දීම**

ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනතේ 8(1) උප වගන්තිය ප්‍රකාරව ඉඩම්/ නිවාසවල නීතිමය අයිතිය බැහැර කිරීම සිදු කරනු ලබන අතර මෙම වර්ෂය සඳහා ඉලක්කගත නිවාස/ඉඩම් ඔප්පු 3000 අතුරින් වර්ෂය අවසාන වන විට හිමිකම් ඔප්පු 2947ක් ප්‍රදානය කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 98% කි. මීට අමතරව බදු ඔප්පු 3244ක් ලබා දීමටද මෙම වසරේදී හැකියාව ලැබුණි.

* **සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම, කළමනාකරණ සංස්ථා හා කමිටු ලියාපදිංචි කිරීම.**

අමාත්‍යාංශයට අනුබද්ධිත, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපලවලට අදාල සහතික නිකුත් කිරීම සිදු කරනු ලබන අතර සහාධිපත්‍යය දේපලවල කළමනාකරණ සංස්ථා හා කමිටු ලියාපදිංචිය ද සිදු කරනු ලබයි.
ඒ අනුව මේ වසරේදී ඉලක්කගත පූර්ණකාලීන, අර්ධකාලීන හා තාවකාලික සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම් 114ක් අතුරින් සහතික 31ක් නිකුත් කිරීමට හැකියාව ලැබුණි. තවද අපේක්ෂිත කළමනාකරණ සංස්ථා ලියාපදිංචි කිරීම, ලියාපදිංචිය අලුත්කිරීම් හා අක්‍රිය කිරීම් හා අක්‍රිය කළමනාකරණ කමිටු නැවත සක්‍රිය කිරීම් 603ක් අතුරින් 451ක ප්‍රගතියක් අත්කර ගැනීමට හැකියාව ලැබී ඇත.

## 9.4. තාක්ෂණ අංශය

* **ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය**

රටක ආර්ථික සංවර්ධනයේ දී ඉදිකිරීම් ක්ෂේත්‍රයෙන් සුවිශේෂී දායකත්වයක් සැපයේ. ඉදිකිරීම් කර්මාන්තයේ තිරසරභාවය තහවුරු

කිරීම, ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක් කිරීම සහ කලාපීය වශයෙන් තරඟකාරීත්වයක් ලබා දීමේ හැකියාව ලැබෙන පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ අරමුණින් ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තියක් ඇතිකිරීමේ අවශ්‍යතාවය අතීතයේ සිට පැවතිණි.

2014 වර්ෂයේ දී පාර්ලිමේන්තුව මගින් සම්මත කළ අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත ප්‍රකාරව ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය සම්පාදනය කළ යුතුව ඇත. මෙම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත මගින් ජාතික ඉදිකිරීම් සභාවක් නිර්මාණය කිරීමට අවකාශ සලසා ඇති අතර, එහි සාමාජිකයින් ලෙස ඉදිකිරීම් ක්ෂේත්‍රයට ඍජුවම සම්බන්ධ වන අමාත්‍යාංශ නියෝජනය කරමින් විධායක මට්ටමේ නිලධාරීන් 07 දෙනෙක් ද වෘත්තීය ආයතන නියෝජිතයින් හා ඉදිකිරීම්, පාරිසරික විද්‍යා, කම්කරු සබඳතා, මහජන සෞඛ්‍ය හා වෘත්තිය සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල දක්ෂතා පෙන්වා ඇති ප්‍රවීණයන්ගෙන් ඉදිකිරීම් විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් නම් කරන සාමාජිකයින් 15ක් ද පත් කර ඇත.

ඉදිකිරීම් පිළිබඳව ජාතික උපදේශක සභාවක් ස්ථාපිත කිරීමේ මුඛ්‍ය අරමුණ වන්නේ, ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීමත්, ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය හා පැවැත්මට බද්ධ වූ ගැටළු වෙනුවෙන් පෙනී සිටීමට නිර්දේශ ඉදිරිපත් කිරීමත්ය. ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පනත ප්‍රකාරව ස්ථාපිත කළ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පැවරී ඇත. දැනටමත් කෙටුම්පත් කර ඇති ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය සවිස්තරාත්මකව සාකච්ඡා කිරීමට ජාතික උපදේශක සභාවේ මංගල රැස්වීම 2015.10.19 වැනි දින නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ දී පැවැත්විණි. මහජන මත විමසුම සඳහා ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්ති කෙටුම්පත ත්‍රෛභාෂාවෙන් මුද්‍රිත මාධ්‍ය වෙත නිකුත් කර ඇත. තවද, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා අපේක්ෂාවෙන් ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්ති කෙටුම්පත, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නිල වෙබ් අඩවිය වන www.cida.com තුළ උත්පතනය කර ඇත.

## * ප්‍රසම්පාදන කමිටු පත්කිරීම හා උපදේශක සේවා සැපයීම

2015 වර්ෂය සඳහා අමාත්‍යාංශය යටතේ පවතින සියලුම දෙපාර්තමේන්තුවල ප්‍රසම්පාදන කමිටු පත්කරන ලද අතර ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන කමිටු පත්කිරීම හා ප්‍රසම්පාදන සම්බන්ධ අනෙකුත් කාර්යයන් සියල්ල සාර්ථකව ඉටු කරගැනීම සඳහා අමාත්‍යාංශය මඟින් උපදේශන සේවා ලබාදෙන ලදී. තවද කොන්ත්‍රාත් විචල්‍යයන් සඳහා අනුමැතිය ලබා දීමත් අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ඍජුවම රාජ්‍ය ආයතන වෙත ප්‍රදානය කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතිවල මිල ගණන් සඳහා මෙම අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණ කමිටුවේ අනුමැතිය ලබා දීමත් නිසියාකාරව සිදු කර ඇත. මීට අමතරව ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා උපදේශක සේවා සැපයීමටද පෙර වර්ෂවල මෙන් මෙම වර්ෂයේද අඛණ්ඩව පවත්වාගෙන යාමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණි.

එමෙන්ම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රකාශන සංශෝධනය කිරීම සඳහා අමාත්‍යාංශ දායකත්වය ලබා දීමට කටයුතු කරන ලදී. එමෙන්ම මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩල මට්ටමට අදාල වන ප්‍රසම්පාදන කටයුතු ඉටු කර ඇත.

## * ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

මෙම අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව යන ආයතන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජ පීඨයේ තෙමහල් ගොඩනැගිල්ල, කැළණිය විශ්ව විද්‍යාලයේ නූතන භාෂා පීඨයේ පස් මහල් ගොඩනැගිල්ල, අතුරුගිරිය අධිවේගී මාර්ග අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හා හපුතලේ බොරලන්ද මාර්ගයේ හලුගම පාලම ඉදිකිරීම මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් ජනතා අයිතියට පත් කරන ලද ව්‍යාපෘති කිහිපයක් වන අතර ඊට අමතරව දිවයින පුරා විශාල ව්‍යාපෘති ප්‍රමාණයක වැඩ ආරම්භ කර මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

ඉහත සඳහන් කරනු ලැබූ සියලු ව්‍යාපෘතීන් සඳහා අදාල ආයතන මෙහෙයවීම, ඉදිකිරීම් ව්‍යාපෘතීන් බාධාවකින් තොරව සිදුකර ගෙන යාම සඳහා අදාල තාක්ෂණික සහය ලබාදීම, මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේදි අදාල ආයතන සම්බන්ධීකරණය වැනි අමාත්‍යාංශ මට්ටමින් ඉටුවිය යුතු සියලුම කාර්යයන් නිසි පරිදි ඉටු කිරීමට අමාත්‍යාංශය විසින් මෙම වසරේදී ද කටයුතු කර ඇත.

## 9.5. ජාතික නිවාස කොමසාරිස් අංශය

1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතිය යටතේ රජයට පවරාගත් දේපළ සඳහා කුලී නිවැසියන්ට ඔප්පු ලබාදීම ජාතික නිවාස කොමසාරිස් අංශය මඟින් සිදුකරන අතර 2015 වර්ෂය සඳහා එසේ ලබාදෙන ලද ඔප්පු ප්‍රමාණය 38කි. තවද රජයට පවරාගත් නිවාසවල අයිතිකරුවන් සඳහා වන්දි ලබාදීමට ද 2015 වර්ෂයේ දී අමාත්‍යාංශයට හැකි විය.

නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතිය යටතේ කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබාදීමේදී එක් එක් කුලී නිවැසියන්ගෙන්, නිවාස සඳහා තක්සේරු වටිනාකම අයකර ගන්නා ලද අතර 2015 වර්ෂයේදී එය නිවාස අරමුදල වෙත බැර කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

කෙසේ වෙතත් 2015 වර්ෂය තුළ ජාතික නිවාස කොමසාරිස් තනතුර සඳහා පත් වූ නිලධාරීන් ඉල්ලා අස්වීම හා ස්ථානමාරුවීම මත එම තනතුර සිව්වරක් පුරප්පාඩු වූ අතර එය ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී අභියෝගයක් විය.

## 9.6. අභ්‍යන්තර විගණන අංශය

2015 වාර්ෂික විගණන වැඩසටහන අනුව ආයෝජිත විගණන වාර්තා 30 අතුරින් විගණන වාර්තා 11ක වැඩ නිම කිරීමට හැකියාව ලැබුණද, විගණන වාර්තා 19ක වැඩ අවසන් කිරීමට හැකියාව නොලැබුණි. මීට ප්‍රධාන හේතුව වූයේ විමර්ශන කටයුතු මෙහෙයවීමට හා විගණන කටයුතු සම්බන්ධයෙන් දැනුමක් පවතින පළපුරුදු කාර්යය මණ්ඩලයක් අංශය සතුව නොමැති වීමයි. කෙසේවූවත්, වාර්ෂික විගණන වැඩසටහන් අනුව අපේක්ෂිත මූලික විමර්ශන 06න් මූලික විමර්ශන 04ක් අවසන් කිරීමට 2015 වර්ෂයේදී මෙම අංශයට හැකියාව ලැබුණි.

තවද වාර්ෂිකව පැවැත්වියයුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක්, කාර්තුවට එක් රැස්වීමක් බැගින් පැවැත් වූ අතර එහිදී අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවලට අදාල ගැටලු සාකච්ඡා මාර්ගයෙන් හා උපදෙස් ලබා දීම තුළින් නිවැරදි කර ගැනීමටත් ගැටලු අවම කරගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

# 2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්




ලෝක ජනාවාස දින සැමරුම 2015



කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජ විද්‍යා පීඨය සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම



බොරලන්ද - හපුතලේ පාලම ඉදිකිරීම



සෙවණගල වලවේ C7 ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම



යාපනය විශ්ව විද්‍යාලයේ කළමනාකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම



පේ ආරු ව්‍යාපෘතිය

# 11. 2015 වර්ෂයේදී අමාත්‍යාංශය මුහුණදුන් අභියෝග.

* **අමාත්‍යාංශයේ කාර්යයභාර පුළුල් වීම**

අංක 1897/15 දරණ හා 2015 ජනවාරි මස 18 වන දිනැතිව නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය ලෙස පැවති මෙම අමාත්‍යාංශය, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය ලෙස සංශෝධනය කරන ලද අතර අමාත්‍යාංශයට අනුබද්ධව පෙර පැවති ආයතනවලට අමතරව ආයතන කිහිපයක් අමාත්‍යාංශය යටතට පත් කරන ලදී. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ සංවිධානය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා ශ්‍රී ලංකා ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය යන ආයතන එසේ අමාත්‍යාංශයට අනුබද්ධ කරන ලද ආයතන වේ. මෙමගින් අමාත්‍යාංශයේ පෙර පැවති විෂය ක්ෂේත්‍රයට අමතරව තවත් විෂය ක්ෂේත්‍ර කිහිපයක් එක් වූ අතර එමඟින් වඩා විශාල කාර්යයභාරයන් හා වගකීම් සමුදායක් මෙම අමාත්‍යාංශයට සෘජුවම පැවරිණි.

තවද අහෝසි කරන ලද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාලව පැවති නිමකළ යුතු සංවර්ධන ව්‍යාපෘතීන් විශාල ප්‍රමාණයක කාර්යයන් හා වගකීම් ප්‍රමාණයක් අමාත්‍යාංශයේ විෂය පථයට අනුබද්ධ කරන ලදී. මෙම හේතුව නිසා පසුගිය වර්ෂයට සාපේක්ෂව අමාත්‍යාංශයේ සියලුම අංශවල කාර්යයභාරය සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගිය අතර එක් එක් අංශවල දෛනික කාර්යයන් සඳහාද සැලකිය යුතු බලපෑමක් එමගින් එල්ල විය.

* **අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය ප්‍රසාරණය වීම**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අහෝසි වීමත් සමග එම අමාත්‍යාංශයේ විෂය පථයට අදාල වූ ග්‍රාමීය සංවර්ධන හා දිවිනැගුම යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්හි රාජකාරී කරන ලද නිලධාරීන් 80කට ආසන්න ප්‍රමාණයක් මෙම අමාත්‍යාංශය වෙත අන්තර්ග්‍රහණය කරන ලදී. එම හේතුව නිසා අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය විය. මෙසේ අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ අමාත්‍යාංශය සතුව නොමැති වීම හේතුවෙන් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය කාර්යාල පරිශ්‍ර 3ක ස්ථාපිත කිරීමට සිදු විය. ඒ හේතුවෙන් දෛනික කාර්යයන් සිදු කිරීමේදි දැඩි බාධාවන් වලට මුහුණ දීමට අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයට සිදු විය.

මීට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ලද සහකාර අධ්‍යක්ෂවරුන්, සංවර්ධන සහකාරවරුන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන් 20,000කට ආසන්න ප්‍රමාණයක් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට අන්තර්ග්‍රහණය කරන ලද අතර එම හේතුවෙන් ඔවුන්ගේ පරිපාලන කටයුතු සිදුකිරීමේ වගකීමද අමාත්‍යාංශයට සෘජුවම පැවරිණි. එකී නිලධාරීන්ගේ පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අමාත්‍යාංශයේ ආයතන අංශය සතුව නොමැතිවීම හේතුවෙන් ආයතන අංශය දැඩි අසීරුතාවයන්ට ලක්විය. කෙසේ වුවත් මෙම සියලු කටයුතු මැනවින් කළමනාකරණය කරගැනීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණු අතර එය මෙම වසරේදී අමාත්‍යාංශය මුහුණපාන ලද අභියෝග අතර සුවිශේෂී වේ.

2015 අගෝස්තු මස දී පැවති පාර්ලිමේන්තු මහමැතිවරණයෙන් අනතුරුව අමාත්‍යාංශයේ විෂය පථය නැවත වරක් සංශෝධනය වීමත් සමග ඉහත සඳහන් කරන ලද අමතර කාර්යය මණ්ඩලය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට හා

සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයට අන්තර්ග්‍රහණය කරන ලදී. ඒ අනුව 2015 වර්ෂය අවසානය වන විට අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය.

### * අමාත්‍යාංශ විෂය පථයට එක් වූ ආයතනවල පැවති ආයතනික දුර්වලතා

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය හා සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව යන ආයතනවල කාර්යය මණ්ඩලවල පැවති දුර්වලතා හා බඳවා ගැනීම් පටිපාටි අනුමත නොමැති වීම වැනි කාරණා හේතුවෙන් එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ පාලන අංශයට විශේෂ පරිශ්‍රමයක් දැරීමට සිදු විය.

### * ස්ථිර තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට නොහැකිවීම

අමාත්‍යාංශය සඳහා අනුමතව පැවති ප්‍රධාන මූල්‍ය නිලධාරි තනතුරත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරත්, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගේ හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ හිඟය මත මෙම වසරේදී ද පුරප්පාඩුව පැවතුණි. එසේම ජාතික නිවාස කොමසාරිස් තනතුර 2015 වර්ෂයේදි සිව්වරක්ම පුරප්පාඩු වීම හේතුවෙන් එම අංශයේ කාර්යයන් සඳහා දැඩි ලෙස බාධා එල්ල වූ අතර ප්‍රමාණ සමීක්ෂක තනතුරද අදාල බඳවා ගැනීම් පටිපාටියේ කළයුතු සංශෝධනයන් හේතුවෙන් තවදුරටත් පුරප්පාඩුව පැවතුණි.

තවද ඒකාබද්ධ සේවාවන්ට අයත් සංවර්ධන නිලධාරී සේවයේ හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් හා විශ්‍රාම යාම් හේතුවෙන් වර්ෂය පුරාම සංවර්ධන නිලධාරී හා කළමනාකරණ සහකාරවරුන්ගේ පුරප්පාඩු පැවති අතර ඒ හේතුවෙන් අමාත්‍යාංශයේ දෛනික කාර්යයන් නිසි පරිදි ඉටු කරගෙන යාමට බාධා එල්ල විය.

### * නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි මුහුණපාන ලද අභියෝග

2015 වර්ෂය පුරාවටම "සැමට සෙවණ" නිවාස වැඩසටහන ප්‍රධාන කරගනිමින් නිවාස ඉදිකිරීම් වැඩසටහන් ගණනාවක්ම ක්‍රියාත්මක කරන ලද අතර එම වැඩ සටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රාජ්‍ය භාණ්ඩාගාරයෙන් නිදහස් කරගැනීමේදි පැවති ප්‍රමාදවීම්, නිවාස වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රගතිය නියමිත කාල වකවානු තුළ අත්කර ගැනීමට නොහැකිවීමට දැඩි සේ බලපෑවේය.

තවද දශක ගණනාවකට පසු ක්‍රියාත්මක වූ සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදය පිළිබඳ ඇතැම් ප්‍රතිලාභීන් මෙන්ම ආයතනවල සේවය කරන නවක නිලධාරීන්ගේ අත්දැකීම් අවම වීම හේතුවෙන් නිවාස වැඩසටහන් ආරම්භ කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදි බොහෝ ගැටලුවලට මුහුණපෑමට සිදු විය.

"සැමට සෙවණ" නිවාස වැඩසටහන යටතේ ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා සුදුසු ඉඩම් හා ප්‍රතිලාභින් තෝරා ගැනීමේ දී සිදු වූ ප්‍රමාදවීම් හේතුවෙන් එම වැඩසටහන 2015 සැප්තැම්බර් අග භාගයේදී ආරම්භ කිරීමට සිදු වූ අතර ඉන් අනතුරුව දිවයිනට බලපැවැත්වූ අයහපත් කාලගුණික තත්ත්වයේ බලපෑම් හේතුවෙන් 2015 වර්ෂය අවසානය වන විට එම ගම්මාන සියල්ලෙහි ම වැඩ අවසන් කිරීමට හැකියාව නොලැබුණි.

### * ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මුහුණපාන ලද අභියෝග

මෙම අමාත්‍යාංශය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන සඳහා ඉදිකිරීම් ව්‍යාපෘතීන් ලබාදීමේ ප්‍රධාන මාර්ගය වන්නේ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් මත ව්‍යාපෘතීන් ලබාදීමයි. තවද එම ව්‍යාපෘතීන්වලින් බහුතරයක් රාජ්‍ය අංශයේ ව්‍යාපෘතීන් වේ. පසුගිය වර්ෂයට සාපේක්ෂව

මෙම වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ලැබුණු ඉදිකිරීම් ව්‍යාපෘතීන්වල අඩුවීමක් දක්නට ලැබුණි.

තවද සේවාදායක ආයතන විසින් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම ප්‍රමාද වීම, නිමාව සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම ප්‍රමාදවීම හා ව්‍යාපෘති ආරම්භයේදි සිටි සේවාදායකයා වෙනස්වීම වැනි කරුණු හේතුවෙන් නිශ්චිත කාලරාමුව තුළ ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට හැකියාවක් නොලැබීම මෙම වසරේදි ඉදිකිරීම් ක්ෂේත්‍රය මුහුණපාන ලද ප්‍රධාන අභියෝගයන් විය. තවද වර්ෂය පුරාවටම පැවති අයහපත් කාලගුණික තත්ත්වයද ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රගතිය අඩු වීම සඳහා හේතු සාධක විය.


නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சு
Ministry of Housing & Construction